# ළමා වියේ මානසික ආකූලතාවකට ආයුබෝවන්

- ළමුන් ගොදුරුවන මානසික ආකූලතාවක් මුළුමනින්ම සොයා ගැනේ
- ළමා වියේ මානසික ආකූලතාවට ගොදුරුවන පස් දෙනෙකුගෙන් හතර දෙනකුම පිරිමි ළමුන් වීමේ රහස හෙළිවේ


**යමක් කෙරෙහි දැඩිව එල්බගෙන කල්පනා කරන දරුවන් දැක තියෙනවාද ? තම පැන්සලෙන් විස්තරාත්මක රූ සටහන් සනිටුහන් කරන ඔවුනගේ දළ සටහනක් පවා කාර්මික ඉංජිනේරු ශිල්පියෙකු නැත්නම් ගෘහ නිර්මාණ ශිල්පියෙකු බිහිවීම පිළිබඳ ඉඟි සපයනවා වැන්න. ඔවුනගේ මනසේ තමා අවට ප්‍රදේශයේ පාර තොට පිළිබඳ නිවැරදිම මාර්ග සැලැස්ම සනිටුහන් වී තිබෙනවාද පෙනෙනු ඇත.**

ඒ මාර්ග සියල්ල දිව යන්නේ කොයි අත කොහොම දැයි සිතින් ආවර්ජනය කිරීම ඔවුනට කජු කන්නාසේ පහසුය. ඒ සියල්ලෙන් ඔවුන් සාමාන්‍ය ඔවුනගේ වියේ පසුවන ළමුන් අභිභවන්නේ වසර ගණනාවක පරතරයක් තබමිනි.

හැබැයි ඒ තරමටම ඔවුන් සාමාන්‍ය ළමුන්ගෙන් අවට සිටින්නන් හඳුනා ගන්නා කුළුපගවන දැනුමින් ආපස්සට යන්නේ ද ඒ පරිදිම වසර ගණනාවක පරතරයකිනි. ඉතා සුළු ප්‍රකාශනයක් තම මව් බසින් ප්‍රකාශ කිරීම පවා ඔවුනට උගහටය. බහ තෝරන වියේ පසුවන්නන් පරිදි යම් දෙයක් අසීරුවෙන් හඬ නගා කියනු ඇසෙනු ඇත. ඔවුන් සමාජයෙන් කොන්වන්නේ ඒ පරිද්දෙනි.

මෙවැනි දරුවන් පිළිබඳ ඔබගේ ආකල්පය කුමක්ද ? මීට පරම්පරාවකට පෙරදී නම් ඔවුන් මානසික ආකූලතාවන්ගෙන් (Autism) යුක්ත පිරිසක් ලෙස සමාජයෙන් කොන් කරනු ලැබීම ඒකාන්තය.එමෙන්ම ඔවුන් ජීවිත කාලය පුරාම දැඩි රැකවරණ මැද පසුවිය යුත්තන් පිරිසක් ලෙස වෙන් කරනු ලබන්නන් බවටද නිසැකවම පත්වේ.

එහෙත් අද වන විට මෙය අවශ්‍යයෙන්ම කාන්තාවන් සහ පිරිමින් තුළ පැවතිය යුතු මානසික ස්වභාවයන් දෙකක එක් අන්තගාමී අවස්ථාවක් බව හඳුනාගෙන තිබීම එක් අතකින් මානව වර්ගයා ලැබූ ජයග්‍රහණයක් ද වේ. අතීත් අතට මෙවැනි ළමුන් සම්බන්ධව කටයුතු කළ යුතු නිවැරදි ආකාරය හඳුනා ගැනීමද අනාගතයේ ඔවුනගේ මානසික ආකූලතාවන් නිරවුල් කිරීමට උපකාරී වනු ඇත. එපමණක් නොව ඔවුන් වඩාත් ඵලදායී සමාජ හිතැති පුද්ගලයන් බවට පරිවර්තනය කොට සමාජයට යළි දයාද කිරීමට ද මෙම නව අභීත හෙළිදරව් කිරීම නිසා අවධානය යොමුවී ඇත. ක්‍රේම්බ්‍රිජ් සරසවියේ මනෝ විශේෂඥයෙකු වන සයිමන් බාරොන් කොහෙන් විසින් එළි දැක්වූ "The Essential Difference" නම් පර්යේෂණ කෘතිය මේ පිළිබඳ නව දෘෂ්ටි කෝණයක් සැපයූ ග්‍රන්ථයකි.




මිනිසුන් හඳුනා ගැනීමේ දැනුමෙන් පිරිපුන් සාමාන්‍ය නිරෝගී ගැහැනු ළමයෙකුගේ චිත්‍රයක්. මිනිසුන්, කුරුල්ලන් , සතුන් ගේ දෙර වතුපිටි වලින් යුක්ත චිත්‍ර ඇගේ තේරීමයි. වසර 5 ක් වයසැති ඇ සැබෑ ප්‍රීතියෙනි.


පද්ධති වටහා ගැනීමේ දැනුමෙන් සපිරි සාමාන්‍ය නිරෝගී පිරිමි ළමයෙකුගේ චිත්‍රයක්. යන්ත්‍ර සූත්‍ර, උපකරණ, නැව්, කාර්, රේල්ලු නැත්නම් අවි ආයුධ ඔවුනගේ සුලබ තේරීමයි. වසර 5 ක් වයසැති ඔහු ඇඳ ඇත්තේ රොබෝ කෙනෙකි.

අතීතයේ දී මෙවැනි මානසික ආකුලතාවත් හඳුනාගනු ලැබුවේ ස්නායු ආබාධකාරී තත්ත්වයක් හැටියටය. එය හට ගැනීමේ නිශ්චිත කාරණය හෙළිදරවුව නොතිබුනද මානසික ආකුලතාව දෙස බැලීමට හුරුව තිබුනේ එම දෘෂ්ටියෙහි පිහිටාය. බොහෝ විට උපතේදී ගෙන ආ ජාතමය ලක්‍ෂණ විදහා දක්වන්නක් ලෙස මෙය නම් විය. මෙම ළමුන්ගේ බිළිඳු අවධියේ දී මොළයෙහි වර්ධනය ඉතා දැඩි ලෙස වේගවත්ව සිදුවන බව අනාවරණයව පැවතින. මොවුන්ගේ මානසික වර්ධනය පසුගාමී බවත්, ජීවිත කාලය පුරාම දැඩි සේ රැක බලාගත යුතු බවත් නිගමනයව පැවතිණ. එසේවුවත් අද වන විට මෙම මානසික ආකුලතාවන්ගේ විවිධ ස්වරූප පවත්නා බව හඳුනාගෙන ඇත. මිනිසුන්ගේ රුධිර පීඩනය වෙනස් වන්නා සේ මෙම තත්ත්වයද සුළු වශයෙන් ඇතිවන මානසික වෙනස්කමක් බව අද වනවිට නිරීක්ෂණයට භාජනයව ඇත. මෙම වෙනස්කමේ ස්වරූප කවරේද ? එහි සීමාවන් විහිද ඇත්තේ කෙසේද ? සාමාන්‍ය සහ ආකුලතාවත් වෙන් කොට හඳුනා ගත හැකි කඩ ඉර කවරේද ? මෙම ආකුලතාව සෑම විටකම අයහපතටම පමණක් සීමාවේ ද ? මෙම ආකුලතාවන්ගෙන් යුක්ත වූවනට දිය හැකි පණිවුඩය කුමක්ද ? යනු මේ මොහොත වනවිට මේ පිළිබඳ කතා බහ කරමින් පසුවන කාරණාවෝය.


මේ පිළිබඳ පැහැදිලි පිළිතුරක් සපයමින් කේම්බ්‍රිජ් සරසවියේ මනෝ විශේෂඥ සයිමන් බාරොන් කොහෙන් පවසන්නේ මෙම මානසික ආකුලතාව හටගන්නේ විවිධ වූ මානසික මට්ටම් දෙකක් අතර පවත්නා ආබාධකාරී තත්ත්වයක් මත බවයි. ඔහු The Essential Difference නම් ග්‍රන්ථය තුළින් ඉහත ප්‍රශ්න සියල්ලම ඉතා විශ්ලේෂණාත්මකව සාකච්ජා කරන්නේ මේ පසුතලය මත පිහිටාය. එහි එක් මානසික ස්වභාවයක් වන්නේ මිනිසුන් හඳුනා ගැනීමේ දැනුමයි. ඔහු එය Empathizing (E) වශයෙන් නම් කරයි. අනෙක් දැනුම් විශේෂය වන්නේ පද්ධති වටහා ගැනීමේ දැනුමයි. ඔහු එය Systemizing (S) වශයෙන් හඳුන්වයි.මෙම දැනුම් වර්ග දෙකම අප සතු වුවද කරන ලද පර්යේෂණයන් තුළින් ඔහු අනාවරණය කරන්නේ කාන්තාවන් තුළ මිනිසුන් හඳුනා ගැනීමේ දැනුම(E)පිරිමිනට වඩා හොඳින් පවතින බවයි. එමෙන්ම පිරිමින්ගේ පද්ධති වටහා ගැනීමේ දැනුම (S)වඩා ශක්තිමත් බවයි. ඔහුගේ සොයා ගැනීම් අනුව මෙම මානසික ආකුලතාව යනු පද්ධති වටහා ගැනීමේ දැනුමේ (S)අන්තගාමී ස්වරූපයයි. ඒ අනුව පිරිමිනට ආවේණික මානසික ස්වරූපයේ අන්තගාමී අවස්ථාවක් සේ මෙම මානසික ආකුලතාව අර්ථ විවරණව ඇත. මෙවැන්නන්ගේ මිනිසුන් හඳුනා ගැනීමේ ඥානය (E)ඉතා අඩු මට්ටමක පවතී.

සත්‍යය මෙතරම්ම සරළ හා ලඝු කොට සැලකිය නොහැක්කක් වුවත් බාරොන් කොහෙන් විසින් හඳුන්වා දී ඇති මෙම E සහ S නම් නව රාමුව පිරිමි ළමුන් ගැහැනු ළමුන් හා කෙරෙන මානසික ආකුලතාව පිළිබඳ පර්යේෂකයන්ට අලුතින් හිතන්නට බොහෝ දේ පෙන්වා දී ඇත. යම් ආකාරයකින් බාරොන් කොහෙන් මුළුමනින්ම නිවැරදි වන්නේ නම් මෙම මානසික ආකුලතාව යනු තවදුරටත් සුව කළ යුතු රෝගයක් බවට පත් නොවන්නේය. එය මිනිසුන් වටහා ගෙන ඒ අනුව හැඩ ගැසිය යුතු මානසික ස්වරූපයක් පමණක් වන්නේය. එපමණක් ද සමහර විට එය දෙවියන් ලබා දී ඇති තිළිණයක් වීමටද බැරි නැත.

ගැහැනු ළමුන්ට වඩා පිරිමි ළමුන් මානසික ආකුලතාවන්ට ගොදුරුවන බව රහසක් නොවෙයි. මිලියන 12 ක් වන මානසික ආකුලතා සහිත ළමුන්ගෙන් මිලියන 9 ක්ම පිරිමි ළමුන් එය සියයට 80 ක් එය එක්තරා ආකාරයකින් මෙම මානසික ආකුලතාව පිරිමි ළමුන්ගේ සිතුවිලි ස්වරූපයන්ට සම්බන්ධ බව පෙන්වාලන ප්‍රකාශනයක් නොවෙයිද ? පිරිමි ළමුන් ගැහැනු ළමුන්ට වඩා පහසුවෙන් මානසික ආකුලතාවන්ට ගොදුරුවීමේ ශක්‍යතාවෙන් යුතු වේද ? එය සර්ව ප්‍රකාරයෙන්ම එබඳු නොවුවද පර්යේෂකයන් විසින් මිනිස් කණ්ඩායම් වශයෙන් ළදරුවන්, බිළිඳුන් යෞවනයන් සහ වැඩිහිටියන් යොදගෙන කරන ලද පර්යේෂනයන්හිදී ඒ ආකාරයේ පිළිඹිඹුවක් ඉස්මතුවන්නට විය.



**ගැහැනු ළමයින්ගේ නුවණ හැඬි මිටට වඩා දිගලු.**
පාසල් යන වියේ පසුවන ගැහැනු ළමයි පිරිමි ළමයින්ට වඩා කථාන්තර වටහා ගැනීමේ ශක්තියෙන් වැඩියිලු.ඒ විතරක් නොවේ, එයාලට පිරිමි ළමයිනට වඩා ඒවායේ ඇති වැරදි පවා වැටහෙනවාලු. නිව්යෝර්ක් නුවර ඉන්න අවුරුදු හතක් වයසැති මේ දැරියත් ඒ වාගේ හපන්තියක්.



සීමාන්තිකව අන්තයකට ගිය ළමයෙක් යමක් දකින අයුරු. ඔවුන් තමන් දකිනා යමක් ඉතා දැඩි කොට ග්‍රහණය කර ගන්නා නිසා එම මානසික ආකුලත්වය විදහා දක්වමින් අඳිනු ලබන චිත්‍ර වලින් සාමාන්‍ය යෙන් ඇසට පෙනෙන දර්ශන ඉතා විස්තරාත්මක ආකාරයෙන් ප්‍රකාශ කරනු ලබයි.

**ගැහැනු ළමුන්ට වඩා පිරිමි ළමුන් මානසික ආකුලතාවන්ට ගොදුරුවන බව රහසක් නොවෙයි. මිලියන 12 ක් වන මානසික ආකුලතා සහිත ළමුන්ගෙන් මිලියන 9 ක්ම පිරිමි ළමුන් එය සියයට 80 ක් එය එක්තරා ආකාරයකින් මෙම මානසික ආකුලතාව පිරිමි ළමුන්ගේ සිතුවිලි ස්වරූපයන්ට සම්බන්ධ බව පෙන්වාලන ප්‍රකාශනයක් නොවෙයිද ?**

## සැලකිලිමත්වන්න


1. ඔබේ ළමයා අවුරුද්දක් පමණ වන කොටත් මොන මොනවා වත් දෙඩන්නෙ නැත්නම්

2. භාෂාව හදුරන්නට අරඹනත් එක්වරම අත්හැර දමනවා නම්

3. ඇසීමේ ආබාධයක් නැතුව තිබියදීත් ළමයාගේ නම අමතන විට ප්‍රතිචාර නොදක්වයි නම්

4. ඇසට ඇස මුණ ගැසීමෙන් වැළකී හැකිළේ නම්

ඔබේ ළමයාත් ළමාවියේ මානසික ආකූලතාවයකින් යුක්ත අයෙකුවීමේ පෙර නිමිති පහළ කරන්නෙක් වීමට බැරි නැත.එබැවින් වහාම වෛද්‍යවරයෙකු හමුවන්න. මෙවැනි මානසික ආකූලතා ඉතා කඩිනම් ප්‍රතිකාර ලැබේනම් වඩා සතුටුදයක ලෙස සුවකර ගැනීම පහසු වනු ඇත.



**ගීත පිස්සෙක් නෑ තාල පිස්සෙක්**

**පහළොස් හැවිරිදි මේ පිරිමි ළමයාට ස්විට්සර්ලන්තයේ ඕනෑම පොප් ගීතයක් එකවර ඇසූ පමණින් එහි තාලය අනුකරණය කළ හැකියි. හැබැයි වචන නම් මතක නෑ.තාම මෙයාගෙ ප්‍රියතම විනෝදාංශය බබල්ගම් පුබ්බා හැරීමයි.**

අලුත උපන් බිළිඳියන් අතෙහි තබා ගත හැකි සෙල්ලම් බඩුවලට වඩා මිනිස් මුහුණු දෙස බොහෝ වේලාවක් බලා සිටිනු දක්නට ලැබිණ. බිළිඳු පිරිමි දරුවන් පෙන්වූවේ එහි අනෙක් පැත්තයි. වයස අවුරුදු 3 වන විට ළදැරියන් කථාන්තරයන්හි චරිතවල හැඟීම් ළදරුවන්ට වඩා හොඳින් වටහා ගන්නටත්, වයස අවුරුදු 7 වන විට ඔවුන් කථාන්තරවල වැරදි සහගත මිත්‍යා අවස්ථා ග්‍රහණය කර ගැනීමටත් පිරිමි ළමුන්ට වඩා සමර්ථකම් පාන බව සොයාගෙන ඇත. මේ වෙනස කැපී පෙනෙන ලෙස ඉහළ ගියේ මුහුණෙහි ඉරියව් හා කටහඬ ඔස්සේ එම අවස්ථා ප්‍රකාශනයට වැඩිහිටියන්ට තියම කළ අවස්ථාවලදීය. තොටිල්ල පදවන හස්තය ලොව මෙහෙයවනවාවත්ද ?

ඉතින් පිරිමින් එහෙම පිටින්ම බලාපොරොත්තු කඩ කරගත යුතු නැහැ. ඔවුනට තම ජීවිත කාලය පුරාවටම ලැබී ඇති වරප්‍රසාදය නම් අවකාශය හා යන්ත්‍රසූත්‍ර පිළිබඳව පවත්නා නිපුණත්වයය. එසේම සමාජමය වාතාවරණයද මේ කෙරෙහි බලපාන සාධකයක් බවට පත්ව ඇත. අපි අවුරුදු දෙකක පිරිමි ළමයෙකුගෙ හැසිරීම දෙස බලමු. ඔහු යාන වාහන ඉදිකිරීම් ආදී වැඩ කටයුතු සමඟ සෙල්ලම් කිරීමෙන් කෙතරම් සතුටක් ලබනවාද ? මේ කතාවෙ තවත් වැදගත් කොටසක් ඇත. එය හෙළිදරව් වන්නේ මනෝ විද්‍යාඥයන් දෙදෙනෙකුවන ජෙරීන් ඇලෙක්සැන්ඩ්‍රා සහ මෙලිස්සා හිත්ස් විසින් වඳුරන් සහ සෙල්ලම් බඩු හයක් යොදගෙන සිදුකරන ලද පර්යේෂණයකිනි. එහි දී වඳුරන්ගේ අවධානයට පාත්‍ර වූවේ පිරිමි ළමුන් ප්‍රියකරන බෝලයකට සහ කාරයකටයි. වැඳිරියන් වඩා ප්‍රිය වූවේ බෝනික්කෙකුට සහ කළයකටයි. ලිංග භේදය ඉස්මතු නොවන පින්තූර පොතකට සහ සෙල්ලම් බල්ලෙකුට දෙපිරිසම සමාන සැලකිල්ලක් දක්වා ඇත. මෙමගින් ලිංගික හෝමෝනය අපගේ මොළය සහ සිරුර තුළ සිදුකරන වැඩ කටයුතු පිළිබඳ තොරතුරු සැපයීමට සමත් විය. මේ තත්වය මූලික වශයෙන් බාරොන් කොහෙන් විසින් කරන ලද E වර්ගය හා S වර්ගය පිළිබඳ නියාමය ඔප්පු කරවන්නක් බඳු විය.

මෙම තොරතුරු ළමුන්ගේ මානසික ආකූලතාවන් හා බද්ධවන්නේ කෙසේදැයි වටහා ගැනීම එතරම් දුෂ්කර නොවේ. සාම්ප්‍රදයිකව මානසික ආකූලතාවයන්ගෙන් පෙළෙන ළමුන් මිනිසුන්ගේ හැඟීම් කෙරෙහි දැක්වූවේ අර්ථ ශූන්‍ය ප්‍රතිචාරය අවුරුදු 15 ක මානසික ආකූලතාවයන්ගෙන් යුක්ත දරුවෙකු සමඟ කතා බහ කරන්න උත්සාහ කර බලන්න. එය කෙතරම් අපහසුදැයි ඔබට වැටහේවි. ඔහුගේ වදන් උකහා ගැනීමේ හැකියාව අවුරුදු 2 ක ළමයෙකුගේ තත්ත්වයට සමාන බව ඔබට වැටහේවි. එසේ වුවත් ඔවුනගෙන් සංගීතයට ප්‍රිය අයෙකුට ඕනෑම ගීතයක් අසන්නට දෙන්න. එක වදනක්වත් මතක නැති වුනාට එහි තාලය අපූරුවට ඔවුන් විසින් අනුකරණය කරනුඇත. එසේ වුවත් ඔවුනගේ පවත්නා සන්නිවේදන සබඳතාවන් හි ඇති දුබලතාව ඔවුන් ක්‍රීඩා ආදියෙන් ඈත්ව හුදකලා කිරීමට හේතු වී ඇත.

"මිනිසුන් එන්නේ කුමකටදැයි ඔවුනට වටහා ගන්නට බැරිය. එසේ වුවත් ඔවුන් පද්ධති විශ්ලේෂණ කාර්යයන්හි විශිෂ්ඨයන්ව සිටී. ඔවුන් වැඩිවියට පත්වූවද ද්‍රව්‍ය ඒකරාශිකරණය ආදියට වැඩි කැමැත්තක් දක්වයි. ඒ කැලිෆෝනියා සරසවියේ වෛද්‍ය බ්‍රයන් සීගල්ගේ අදහසයි. "ඔවුන් තොරතුරු ඒකරාශිකරණයටද දක්ෂයි ඔහු පවසයි.

මවක් සිය මානසික ආකූලතාවන්ගෙන් යුත් පුතා සහ නිරෝගී දූව සමග " Finding Nemo"නම් සුරතල් මත්ස්‍යයෙකු පිළිබඳ ගෙතුනු කතාන්තරයක් රඟත් චිත්‍රපටයක් බැලීමට ගියේය. එහිදී සුරතල් මාළුවාගේ මව අහිමි වූ අතර පියාගෙන් වෙන්වීමට සිදුවිය. කුඩා දියණියට දැන ගැනීමට අවශ්‍ය වූවේ මාළුවා බියවූවාද නැතිද යන කාරණයයි. ආබාධිත දරුවාට දැන ගැනීමට අවශ්‍ය වූවේ මාළුවා ඇත්ත වශයෙන්ම ගනු ලබන ආහාරය කුමක්ද යන්නයි.

මෙවැනි අය ඔවුන් ළමා වේවා, වැඩිහිටි වේවා තොරතුරු රැස් කිරීමේ සහ ස්මරණයේ රුසියෝ වෙති. 1947 සිටBillboardසඟරාවේ පළවූ හොඳම ගීත දහයේ ලැයිස්තු මේට්ලන්ඩ් නගරයේ සිටින මෙවන් වැඩිහිටියෙකුට අසුරු සැනින් මතක් කළ හැකිය. ඔබේ උපන් දිනය කියන්න. එකල ගැයුණු ගීතවල නාම ලේඛනය ඔහු සපයනු ඇත. වඩා විස්තරාත්මක තොරතුරු අවශ්‍යවන ගුවන්යානා පද්ධති කාර්යයන්හි පවා මොවුන් හොඳින් යොදගත හැකිවෙන බව සමහරුන්ගේ අදහසයි. ඔබ ඕනෑම ලෙසකට රූපයක් කැබලිකර මොවුනට දෙන්න. එය යළි සැකසීම, ඔවුනට ඔබට මෙන් දුෂ්කර කාර්යක් නොවනු ඇත.

ඔව් මෙවැනි මානසික ආබාධයන්ගෙන් යුත් ළමුන් වේවා වැඩිහිටියන් වේවා මිනිස් හැඟුම් හා ඉරියව් පිළිබඳ ගැටළු විසඳීමේ දී දුර්වලතා දක්වන බව ඇත්තකි. එහෙත් ඔවුන් වඩා හොඳින් සංකීර්ණතා බහුල ක්‍රියාදමයන් වටහා ගනු ඇති බවත් එලෙසම දැකගත හැකිවනු ඇත. මිනිසුන් හඳුනා ගැනීමේ ඥානයෙන් යුක්ත අය " කෙනෙක් කුමක් කීවත් ඔහු එයින් අදහස් කළේ කුමක්ද කියන එක මට නම් හංගන්න බෑ" යැයි කියන පරිදි, පද්ධති වටහා ගැනීමේ ඥානයෙන් යුක්ත වුවත් "යන්ත්‍රයක ක්‍රියාකාරීත්වය මගේ සිත වශී කරනවා" යැයි පවසන්නෝ වෙති. බාරොන් කොහෙන් විසින් කරන ලද පර්යේෂණයකදී මෙවැනි මානසික ආකූලතාවන්ගෙන් යුතු වුවත් වැඩිහිටියන් වෙත්ම ඔවුනට මිනිස් හැඟුම් වර්ධනය කර ගැනීමේ දැනුම තරමක් දුරට වර්ධනය කර ගත හැකි බව සොයාගෙන තිබේ.

එහෙත් සාමාන්‍ය ගැහැනු සහ මිනිසුනට වඩා මොවුනගේ පද්ධති වටහා ගැනීමේ නුවණ නම් සැම කල්හිම ඉදිරියෙන් සිටින බව නිරනුමානය.

## දෙනෙත ආත්මය පෙන්වන කැඩපතයි




### අපි දෑස් සමඟ කතාකරමු

මුහුණෙහි ඇතිවන වචනයෙන් ප්‍රකාශ නොවන ඉඟියක්, සුළු වෙනස්කමක් වදන් දහක පණිවුඩයක් කියාපායි. මේ දෑස් දෙස බලා ඔවුන් කියන පණිවුඩය වටහාගන්නට ඔබට හැකිදැයි උත්සාහ කර බලන්න.

A. කමාව ඉල්ලන බැල්මක්
කරුණාබර බැල්මක්
නොසන්සුන් බැල්මක්
අධෛර්යට පත් මිලානික බැල්මක්

B. සෙල්ලක්කාර බැල්මක්
සිත අස්වසන සතුටුදායී බැල්මක්
කෝපය අවුස්සන බැල්මක්
වෙහෙසකර තීරස බැල්මක්

C. කවටකමක්
සිත කලබලයෙන්
ආසාවෙන් ඉල්ලා සිටීමක්
ඒත්තු ගැන්වීමක්

D. පරීක්ෂාකාරී විපරම් බැල්මක්
බලකර ඉල්ලා සිටීමක්
කරදරයට පත් බැල්මක්
ත්‍රස්තව භයට පත් බැල්මක්

E. දෙම්නසට පත් බවක්
සහනය සැලසීමක්
කුලැටි බවක්
උනන්දු කිරීමක්

F. පීඩාවට පත්වීමක්
විරුද්ධ වීමක්
තැති ගැන්මක්
සිත වෙනදේක යොමුව තිබීමක්

### අපේ නිවැරදි ඉඟි

A . නොසන්සුන් බැල්මක්.
B . සෙල්ලක්කාර බැල්මක්.
C. ආසාවෙන් ඉල්ලා සිටීමක්.
D. පරීක්ෂාකාරී විපරම් බැල්මක්.
E. දෙම්නසට පත් බවක්.
F. සිත වෙන දේක යොමුව තිබීමක්

ඇත්ත වශයෙන්ම මෙවැනි මානසික ආකුලතාවන්ගෙන් යුත් අය හුදු පද්ධති වටහා ගැනීමේ දැනුමේ අන්තයට ගිය අය පමණක් නොවෙති. ඔවුහු එහි අසාමාන්‍ය ආකාරයෙන් විශිෂ්ඨත්වයට පත්වූවෝ වෙති.

සාමාන්‍ය ළමයෙකු දුම්රියක් අඳිනු ලබන්නේ එහි මුහුණතෙහි සිට හෝ හතරැස් ඍජු කෝණාස්‍රාකාර පෙට්ටිටකට රෝද සවි කිරීමෙන් විය හැකිය. එහෙත් මෙවැනි මානසික ආබාධයන් ඇති ළමයි එහි පරිධියේ සිටම විශාල තොරතුරු සම්භාරයක් සහිතව රූප සටහන් ගොඩ නගනු ලබයි. එම ගොඩ නැඟීම තාත්විකව කරන්නක් නොව පිටපත් කරන්නෙකු කරනු ලබන ආකාරයටයි ඔවුන් විසින් අඳිනු ලබන්නේ.

එංගලන්තයේ පසුවන මෙවන් එක් චිත්‍ර ශිල්පියෙකු ගේ චිත්‍ර විමර්ශනයට බඳුන් කළ ස්නායු වෛද්‍යවරයෙකු පැවසුවේ එවන් චිත්‍ර නිර්මාණයට සාමාන්‍ය බුද්ධිය ඉක්ම වූ සුවිශේෂිත ඥානයක් අවශ්‍යවන බවයි.

"අප යමක් දෙස බැලූවද ඉක්මනින්ම එහි බොහෝ දේ අමතක කරනවා. මෙවැනි මානසික ආකුලතාවන්ගෙන් යුක්ත අය යමක් හැඳින්වීමේ දී "ඒක කෝච්චියක්" එය මැෂිමක් වැනි වදන් ප්‍රකාශ කළ ද ඔවුන් ඒ දෑ මුල සිට අගට දකිනවා."

මතකය, ඉක්මන් ගණනය සහ අන්තයට ගිය හැඟීම් මොවුනතර පොදු ලක්ෂණ කීපයකි. මේ පිළිබඳව පර්යේෂණ කරන්නවුනට අනුව බිළිදෙකුගේ පළමු වසරේ දී මෙවැනි අයගේ මොළය අති ධාවනකාරීව වර්ධනය වෙනු ලබයි. මොළයට දැරිය නොහැකි තරම් තියුරෝන් ප්‍රමාණයක් එක් රැස්වීම නිසා මොළයේ සංගත ජාලීය වෙනස්කම්ද මෙම තත්ත්වයට දායකවන්නට ඇත.

බාරොන් කොහෙන් මෙවන් කාරණා සමග තර්ක විතර්ක කරන්නේ නැත. E - ආකෘතිය මානසික ආකුලත්වය පිළිබඳ සියලු වෙනස්කම් අසුකර ගැනීමට ගොඩ නැංවූවක් නොවන බව ඔහු පවසයි. එසේ වූවත් එය මෙතෙක් මෙම මානසික ආකුලතාව දෙස බැලූ පටු ආකාරය ඉතා දැවැන්ත ලෙස පුපුරුවා හැරීමක් බව ඔහුගේ විශ්වාසයයි.

තවත් මතකයට අනුව E - S ආකෘතිය මානසික ආකුලතාවන්ගෙන් යුක්ත වූවක් දෙස යුක්ති සහගත සහ ගෞරවයෙන් හෙළන ලද බැල්මක් ලෙසද හඳුන්වයි.

හිතන්න, සුළු මට්ටමේ මානසික ආබාධකාරී තත්ත්වයන්ට ගොදුරුවූවන්ට පවා මෙතෙක් ජීවත්වීමට සිදුවූනේ කරදියේ මසුන් මිරිදියට ඔබා ජීවත්විය යුතු යැයි පවසනු ලබන ආකාරයෙන්. මෙවන් එක් රෝගියෙක් බාරොන් කොහෙන්ට පැවසුවේ "ඔබට,, අප සුදුසු වාතාවරණයක පිහිටුවීමට හැකි ආකාරයක් යෝජනා කළ හැකිනම් කෙතරම් අගනේද ? එහෙත් තවමත් අපට ලෝකයේ ජීවත්වීමට සිදුව ඇත්තේ අබ්බගාතයන් ලෙස " යනුවෙනි.

මානසික ආබාධයන්ගෙන් පෙළෙන ලේබලය අලවා අපකීර්තියට පත්වන සමහර අය කිසිසේත්ම මානසික ආබාධයන් ඇත්තන් නොවන බවද මෙමගින් අනාවරණය විනි. දැන් ඔවුනට නිදහස්ව ලෝකය දෙස බැලිය නොහැකි ද ?

ඔබ දන්නවාද, තමා කිසිඳු මානසික ආබාධයකින් නොපෙළෙතියි සිතා ගත් අයද සමාජයෙහි ජීවත්වන බව එංගලන්තයේ ඩේවි ස්පයිසර් එවැන්නෙකි. 46 වැනි වියේ පසු වූ ඔහු පරිගනක සැලසුම්කරුවෙකු හා පද්ධති සකසන්නෙකු ලෙස ජීවිකාව කළෝය. ඔහුගේ සය හැවිරිදි පුතා පරීක්ෂණයකට ලක් කළ අතර ඔහුටද එබඳු පරීක්ෂණයක් කළේය. පුතා සාමාන්‍ය අයෙකු බවත් ප්‍රතිකාර අවශ්‍ය පියාට බවත් අනාවරණය විය. තමාට මානසික ආබාධකාරී තත්ත්වයක් ඇතැයි ඔහු අවබෝධ කර ගන්නා විට ඔහුට ඒ හිලව්වට දීග දෙකක් අත් හැරීමටද රැකියාවට ආයුබෝවන් කීමටද සිදුවී තිබුණි. ඔහු මිනිසුන් හඳුනා ගැනීමේ ඥානය වර්ධනය කර ගැනීම ඇරඹුවේය. අලුතින් ඉගෙන ගන්නට ද පටන් ගත්තේය. ඔහු වඩාත් සමාජශීලි ආකාරයෙන් ටෙනිස් ක්‍රීඩාවේ යෙදුනි. අලුත් ජීවිතයක උදානයක් ඇතිවිය. දැන් ඔහුට මිනිසුන් වඩාත් ප්‍රසන්නව පෙනේ.

හිතන්න එපා මෙවැනි මානසික ආකුලතාවන් ඇතියවුන්ට රැකියා සොයා ගැනීම ඉතා අපහසුයි කියා. සාමාන්‍ය අයට වඩා හොඳින් මොවුනට කළ හැකි කාර්යයන් අනන්තයි. රෙදි පිළි කර්මාන්තයේ සුපරීක්ෂණ කටයුතු "ඉන්වෙන්ට්‍රි" පවත්වාගෙන යාම යනාදී රැකියා පමණක් නොව සබ්මැරීනවල අති දුෂ්කර නඩත්තු කටයුතු පවා මොවුනට පහසුවෙන් සිදුකළ හැකි කාර්යයන් බව ඔප්පු වී හමාරයි. ඇමෙරිකාවේ සමහර ආයතන මොවුනට රැකියාදීමට පුල පුලා බලා සිටී. "ඇත්තෙන්ම වෙනත් සේවකයෝ නිවාඩු ගන්න අපට කරදර කරනවා. ඒත් අපි මොවුන්ට කියනවා ඔබ නිවාඩු ගන්න කියා " එහි එක් ප්‍රධාන නිලධාරිනියක් පවසන්නීය.

"එහෙත් මෙවැනි මානසික ආකුලතාවන්ගෙන් මිදීමට ක්‍රමවේදයන් අවශ්‍ය වෙනවා". ආචාර්ය උපාධියකට සූදානම් වෙන බොස්ටන් සරසවියේ සිටින ඉතා සුළු මානසික ආබාධකාරී තත්ත්වයකට ලක්වූ ශිෂ්‍යයෙක් පවසනවා. "අප සිතන්නෙ ලෝකයේ පවත්නා සෑම දෙයක්ම නීති රීතිවලට අනුව සිදුවනවා කියා. ඒත් එය එසේ නොවන බව වටහා ගැනුම සඳහා අවශ්‍ය ඥානය ලබාගත යුතු වෙනවා. එය වර්ධනය කර ගැනීම මෙහිලා අවශ්‍ය මූලික පදනමයි. ඒ සඳහා මිනිසුන් හඳුනා ගැනීමේ ඥානය උපකාරීවනු ඇත." තවත් අයකු සමඟ එක්ව ගත කිරීම පීඩාකාරී දෙයක් නොව සුමිහිරි සුභාෂිතයක් බව තේරුම් නොගත් කවුරු කවුරුත් මේ ලිපිය නැවත වරක් කියවනව නම් හොඳයි.

❑

**රත්න පතිරණ**
**Newsweek ඇසුරෙනි**